# අධ්‍යාපන අමාත්‍යාංශය

# කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

## සූර්ය පැනල විදුලි පද්ධති සවි කිරීම සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කාර්මික හා තාක්ෂණ විද්‍යාල වල වහල කුලී පදනම මත ලබා දීම.

**ව්‍යාපෘති යෝජනා කැඳවීම**

සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා උත්පාදන පද්ධති සවි කිරීම සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කාර්මික හා තාක්ෂණ විද්‍යාල 35 ක වහල කුලී පදනම මත ලබා දීම සඳහා පිළිගත් ආයතන වලින් සහ පුද්ගලයන්ගෙන් 2024/12/30 දින පෙ.ව. 10.00 දක්වා ව්‍යාපෘති යෝජනා කැඳවනු ලැබේ. මෙම විද්‍යාල පිළිබඳ විස්තර www.dtet.gov.lk දෙපාර්තමේන්තු වෙබ් අඩවිය පරිශීලනයෙන් හා 0713920690 දුරකතන අංකයෙන් ලබා ගත හැක.

ඉහත ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති සමාගම් හා පුද්ගලයින්ට ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීමට ආරාධනා කෙරේ. විද්‍යාල පරිශ්‍රයන් පරික්ෂා කර බැලීමෙන් පසු එක් එක් විද්‍යාල සඳහා වෙන වෙනම ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කල යුතුය. මේ සඳහා අවශ්‍ය ලේඛණ 2024/10/20 සිට 2024/11/15 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා වූ කාර්යාල වේලාව තුල කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයෙන් (දෙවන මහල) ශ්‍රී ලංකා රුපියල් තුන්දහසක් (රු.3,000.00) වන ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් පසු ලබා ගත හැක.

ආපසු නොගෙවන තැන්පතු මුදල මහජන බැංකුව නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-10001-3-9026228 දරණ ගිණුමට **"අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව"** නමින් ගෙවා 2024/10/20 දින සිට 2024/11/15 දින දක්වා කාලය තුල සතියේ වැඩ කරන දින වල පෙ.ව.9.30 - ප.ව.2.30 අතර ඕනෑම වෙලාවක එම ලදු පත ගිණුම් අංශය වෙත ඉදිරිපත් කිරීමෙන්, ටෙන්ඩර් ලියකියවිලි ලබා ගත හැක.

**යෝජනා ඇපකරය**

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඕනෑම වාණිජ බැංකුවකින් හෝ මුදලින් එක් විද්‍යාලයකින් ශ්‍රී ලංකා රුපියල් ලක්ෂයක් (රු.100,000.00) බැගින් වන යෝජනා ඇපකරයක් ව්‍යාපෘති යෝජනාව සමග ඉදිරිපත් කල යුතුය. යෝජනාවේ වලංගු කාලය 2025/03/31 දින දක්වා විය යුතු අතර, යෝජනා ඇපකරය 2025/04/29 දින දක්වා වලංගු විය යුතුය.

යෝජිත සමාගම් හෝ පුද්ගලයන් තම ලංසු යෝජනා 2024/12/30 දින පෙ.ව.10.00 හෝ ඊට පෙර කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය වෙත භාර දිය යුතුය. යෝජනා ඉදිරිපත් කිරීමේ වේලාව (2024/12/30 දින පෙ.ව.10.00) අවසන් කිරීමෙන් පසු වහාම යෝජනා විවෘත කරනු ලැබේ. යෝජකයන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට යෝජනා විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැක.

යෝජනා සකස් කිරීම හෝ භාර දීම සම්බන්ධයෙන් යෝජකයින් විසින් දරනු ලබන වියදම් සඳහා මෙම දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

**පූර්ව ලංසු රැස්වීම**

පූර්ව ලංසු රැස්වීම 2024/11/20 දින පෙ.ව.10.00 ට දෙපාර්තමේන්තුවේ දෙවන මහලේ රැස්වීමේ ශාලාවේ පැවැත්වේ.

යෝජකයන්ට අවශ්‍ය වැඩිදුර තොරතුරු කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී, දුරකථන අංක 0713920690 විමසීමෙන් ලබා ගත හැක.

ඕනෑම අවස්ථාවක ඇති එක ව්‍යාපෘති යෝජනාවක් හෝ යෝජනා කිහිපයක් හෝ යෝජනා සියල්ල භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ හිමිකම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුය.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ.පෙ.557,ඕල්කට් මාවත,කොළඹ 10.